# WEATHER FORECAST FOR 12 AUGUST 2019

## (Issued at 1200 noon on 11 August 2019)

**Prevailing showery and windy condition is likely to continue in South-western parts of the island tomorrow.**

There is a possibility for sudden increase of wind speed up to (60-65) kmph in North-western, Western, Sabaragamuwa, Central and Southern provinces and (40-50) kmph in North-central province and in Trincomalee district.

Showers or thundershowers will occur at times in Western, Sabaragamuwa, Central, Southern and North-western provinces. Light showers will occur in Mannar, Jaffna and Anuradhapura districts.

Fairly heavy falls above 75 mm are likely at some places in Western, Sabaragamuwa and Central provinces and in Galle and Matara districts.

**There may be temporary localized strong winds during thundershowers. General public is kindly requested to take adequate precautions to minimize damages caused by lightning activity.**

දිවයිනේ නිරිත දිග කොටසේ දැනට පවතින වැසි සහ සුළං තත්ත්වය හෙට දිනයේදීත් පවතිනු ඇත.

වයඹ, බස්නාහිර, සබරගමුව, මධ්‍යම සහ දකුණු පළාත්වල සුළඟේ වේගය පැ.කි.මී. (60-65) දක්වාද, උතුරු-මැද පළාතේ සහ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ සුළඟේ වේගය පැ.කි.මී. (40-50) දක්වාද ක්ෂණිකව ඉහල යාමේ හැකියාවක් පවතී.

බස්නාහිර, සබරගමුව, මධ්‍යම, දකුණු සහ වයඹ පළාත්වල විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවේ. මන්නාරම, යාපනය සහ අනුරාධපුර දිස්ත්‍රික්කවලත් සිහින් වැසි ඇතිවේ.

බස්නාහිර, සබරගමුව සහ මධ්‍යම පළාත්වලත් ගාල්ල සහ මාතර දිස්ත්‍රික්කවලත් ඇතැම් ස්ථාන වලට මි.මී. 75 ට වැඩි තරමක් තද වර්ෂාපතනයන් අපේක්ෂා කල හැක.

ගිගුරුම් සහිත වැසි ඇති වන විට එම ප්‍රදේශවල තාවකාලිකව තද සුළං ඇති විය හැක. අකුණු මඟින් සිදුවන අනතුරු අවම කර ගැනීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ජනතාවගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ

## WEATHER FORECAST FOR SEA AREAS AROUND THE ISLAND DURING NEXT 24 HOURS (Issued at 1200 noon on 11 August 2019)

**Northern and Central Arabian Sea areas can be very rough or high at times as the wind speed can increase up to (70-80) kmph at times and Central Bay of Bengal sea areas can be very rough at times as the wind speed can increase up to (60-70) kmph at times.**

**Fishermen are informed that it is dangerous to venture further into Northern and Central Arabian Sea areas.**

Showers or thundershowers will occur at times in the sea area extending from Mannar to Hambantota via Puttalam and Galle.

Winds will be South-westerly and speed will be (30-40) kmph in the sea areas around the island.

**The sea area extending from Hambantota to Pottuvil can be very rough at times as the wind speed will increase up to (60-70) kmph at times.**

**The sea area extending from Puttalam to Hambantota via Colombo and Galle will be rough at times as the wind speed will increase up to (50-60) kmph at times.**

**Wind speed can increase up to (40-50) kmph at times and seas can be fairly rough at times in the other sea areas.**

**Temporarily strong gusty winds and rough seas can be expected during thundershowers.**

**Naval and fishing communities are requested to be vigilant in this regard.**

**<u>ඉදිරි පැය 24 සඳහා දිවයින වටා ඇති මුහුදේ කාලගුණ තත්ත්වය</u>**
**<u>2019 අගෝස්තු මස 11 දින මධ්‍යහන 1200 ට නිකුත් කරන ලදි.</u>**

උතුරු සහ මධ්‍යම අරාබි මුහුදු ප්‍රදේශවල සුළගේ වේගය විටින් විට පැ.කි.මී. (70-80) දක්වා වැඩි විය හැකි අතර එවිට එම මුහුදු ප්‍රදේශ විටින් විට ඉතා රළු හෝ දළ රළු විය හැක. මධ්‍යම බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශයේ සුළගේ වේගය විටින් විට පැ.කි.මී. (60-70) දක්වා වැඩි විය හැකි අතර එවිට එම මුහුදු ප්‍රදේශ විටින් විට ඉතා රළු විය හැක.

උතුරු සහ මධ්‍යම අරාබි මුහුදු ප්‍රදේශවල ධීවර සහ නාවුක කටයුතුවල යෙදීම තවදුරටත් අනතුරුදායක බව දැනුම් දෙනු ලැබේ.

මන්නාරම සිට පුත්තලම සහ ගාල්ල හරහා හම්බන්තොට දක්වා වන මුහුදු ප්‍රදේශවල විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවේ.

දිවයින වටා වන මුහුදු ප්‍රදේශවල සුළං නිරිත දෙසින් හමා එන අතර සුළගේ වේගය පැ.කි.මී. (30-40) පමණ වේ.

හම්බන්තොට සිට පොතුවිල් දක්වා මුහුදු ප්‍රදේශවල සුළගේ වේගය විටින් විට පැ.කි.මී. (60-70) දක්වා වැඩි විය හැකි අතර එම මුහුදු ප්‍රදේශ විටින් විට ඉතා රළු විය හැක

පුත්තලම සිට කොළඹ සහ ගාල්ල හරහා හම්බන්තොට දක්වා මුහුදු ප්‍රදේශවල සුළගේ වේගය විටින් විට පැ.කි.මී. (50-60) දක්වා වැඩි වන අතර එම මුහුදු ප්‍රදේශ විටින් විට රළු වේ.

දිවයින වටා වන සෙසු මුහුදු ප්‍රදේශවල සුළගේ වේගය විටින් විට පැ.කි.මී. (40-50) දක්වා වැඩි විය හැකි අතර එම මුහුදු ප්‍රදේශ විටින් විට තරමක් රළු විය හැක.

ගිගුරුම් සහිත වැසි ඇති වන විට එම ප්‍රදේශවල තාවකාලිකව තද සුළං ඇති විය හැකි අතර එවිට එම මුහුදු ප්‍රදේශ තාවකාලිකව රළු විය හැක.

ධීවර සහ නාවුක ප්‍රජාව මේ පිලිබදව ඉතා අවධානයෙන් කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.

කාලගුණ විද්‍යාඥ (Duty Meteorologist),
කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව (Department of Meteorology)

EMERGENCY OPERATIONS DIVISION
RECEIVED
Date : 2019/08/11
Time : 1220 hrs
D (Ops)/DO/ADO
DISASTER MANAGEMENT CENTRE